* පෙළපොතේ අදාළ ඒකකය කියවා ඊට අයත් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න

1 ඒකකය - ශ්‍රී ලංකාවේ සංවර්ධනයට කෘෂිකර්මාන්තයේ දායකත්වය

1. කෘෂිකර්මයේ ප්‍රධාන අංශ දෙක ලියන්න ?
2. ගොවි යුගයට පෙර මිනිසා පසු කළ යුග දෙක නම් කරන්න ?
3. සතුන් හීලෑ කර ගනිමින් සතුන් ඇති කර ප්‍රයෝජන ලබාගත් යුගය නම් කරන්න ?
4. පුරාණයේදී රජරට හැඳින්වූ නම කුමක්ද ?
5. අනුරාධපුර යුගයේ ඉදි කෙරුණු පළමු වැව නම් කරන්න?
6. එය වර්තමානයේ හඳුන්වන නම කුමක්ද ?
7. මින්නේරි දෙවියන් ලෙස දේවත්වයෙන් පුද ලබන රජු කවිද ?
8. කලාවැව කරවූ රජතුමා කවිද ?
9. එල්ලංගා පද්ධතිය යනු කුමක්ද ?
10. ධාතුසේන රජු විසින් කරවන ලද විස්මිත වාරි නිර්මාණය කුමක්ද?
11. එම වාරි මාර්ගය ඔස්සේ ජලය ගෙනයන්නේ කොහේ සිට කොහාටද ?
12. එහි දිග හා පළල කොපමණද ?
13. වැවක කොටස් නම් කරන්න ?
14. වැවක වැඩි ජලය ඉවත් කිරීමට සකස් කර ඇති කොටස හඳුන්වන නම කුමක්ද ?
15. බිසෝකොටුව මගින් කෙරෙන කාර්යය කුමක්ද ?
16. "මඩ සෝදාගත් කළ හෙළ ගොවියා රජකමටත් සුදුසුය "යන ප්‍රකාශය කළේ කවිද ?
17. වෙල්ලස්ස ලෙස හඳුන්වන්නේ කුමන පළාතද ?
18. ශ්‍රී ලංකාව පෙරදිග ධාන්‍යාගාරය යන විරුදාවලිය ලැබුවේ කුමන රජ සමයේද ?
19. බ්‍රිතාන්‍යන් විසින් හඳුන්වා දෙනු ලැබූ වැවිලි බෝග මොනවාද ?
20. පේරාදෙණිය උද්භිද උද්‍යානය පිහිටවූ වර්ෂය කුමක්ද ?
21. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ආරම්භ කළේ කුමන වර්ෂයේද?
22. ශ්‍රී ලංකාවේ ප්‍රථම බහු කාර්යය යෝජනා ක්‍රමය කුමක්ද?
23. මහවැලි යෝජනා ක්‍රමයට අයත් ජලාශ නම් කරන්න ?
24. මෑතකදී ඉදිවූ බහු කාර්යය යෝජනා ක්‍රමය නම් කරන්න ?
25 හරිත විප්ලවය ආරම්භ වුයේ කුමන දශකයේද ?
26. හරිත විප්ලවය සමග ඇතිවූ කෘෂිකාර්මික වෙනස්කම් මොනවාද?
27. ආහාර සුරක්ෂිතතාව යන්න හඳුන්වන්න ?
28. ශ්‍රී ලංකාවේ ප්‍රථම දෙමුහුන් වී වර්ගය කුමක්ද ?
29. තේ පර්යේෂණායතනය පිහිටා ඇත්තේ කොහේද?

www.lkedu.lk

30.ශ්‍රී ලංකාවේ සංවර්ධනයට කෘෂිකර්මාන්තය දායක වන ආකාර හතරක් ලියන්න?
31.කාර්මික අංශයට අමුද්‍රව්‍ය සැපයීම සඳහා වගා කරන බෝග දෙකක් ලියන්න ?
32.ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට දායක වන අංශ තුනක් නම් කරන්න ?
33. ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය සඳහා ඇති විභවයන් තුනක් ලියන්න ?
34.කෘෂි රක්ෂණ මණ්ඩලය ආරම්භ කළ වර්ෂය කුමක්ද ?
35.ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු බිහිවූ බහු කාර්යය යෝජනා ක්‍රම හතරක් නම් කරන්න?

2.ඒකකය - කෘෂිකාර්මික කටයුතු කෙරෙහි දේශගුණික සාධක වල බලපෑම

1.කාලගුණය යන්න හඳුන්වන්න ?
2.දේශගුණය යන්න හඳුන්වන්න ?
3.කාලගුණික පරාමිතීන් ලියන්න ?
4.වර්ෂාපතනය යනු හඳුන්වන්න ?
5.වර්ෂාපතනයේ සම්මත ඒකක මොනවාද ?
6.ප්‍රධාන වර්ෂාමාන වර්ග දෙක නම් කරන්න ?
7.වර්ෂාමානයක් ස්ථාන ගත කිරීමේදී සැලකිය යුතු කරුණු මොනවාද ?
8. වර්ෂාමානයක් ස්ථාන ගත කිරීමේදී පුනීල කට පොළොව මටමේ සිට කොපමණ උසකින් තිබිය යුතුද ?
9.උෂ්ණත්වමානයක පාඨාඅංක ගැනීමේදී පොළොවමට්ටමෙන් කොපමණ උසකින් තිබිය යුතුද ?
10.උපරිම හා අවම උෂ්ණත්වමානයකින් සිදු කෙරෙන කාර්යය කුමක්ද ?
11.බෝග වගාව කෙරෙහි ආලෝකය බලපාන ආකාර තුන ලියන්න ?
12.ආලෝක තීව්‍රතාවය යනු කුමක්ද ?
13.ආලෝක තීව්‍රතාවය මනින උපකරණ හා ඒකක ලියන්න ?
14.ආලෝකය පවතින කාලසීමාව මැනීමට භාවිතා කරන උපකරණය කුමක්ද ?
15.ශ්‍රී ලංකාවේ දිගම දිවා කාලය පවතින දිනය හා කෙටිම දිවා කාලය පවතින දිනය ලියන්න ?
16.සාපේක්ෂ ආර්ද්‍රතාවය යනු කුමක්ද ?
17. සාපේක්ෂ ආර්ද්‍රතාවය මනින උපකරණය කුමක්ද ?
18.ආර්ද්‍රතමාන වර්ග දෙකක් ලියන්න ?
19. සාපේක්ෂ ආර්ද්‍රතාවය මනින ඒකක මොනවාද ?
20.සුළඟේ දිශාව හා සුළඟේ වේගය මනින උපකරණ නම් කරන්න ?
21.ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ප්‍රධාන ක්‍රම මොනවාද ?
22.පළමු අන්තර් මෝසමට අයත් මාස සහ දෙවන අන්තර් මෝසමට අයත් මාස මොනවාද
23.යල කන්නයට අයත් මාස ලියන්න ?
24.මහ කන්නයට අයත් මාස ලියන්න ?
25.වර්ෂාපතනයේ හිතකර බලපෑම් තුනක් ලියන්න ?
26. වර්ෂාපතනයේ අහිතකර බලපෑම් තුනක් ලියන්න ?
27.ශ්‍රී ලංකාවේ මාසික වර්ෂාපතන ව්‍යාප්තිය කුමන හැඩයක් ගනීද ?

www.ikedu.lk

28.පරිසර උෂ්ණත්වය වෙනස් වීමට බලපාන සාධක මොනවාද ?
29.අල බෝග වල ආකන්ද ඇති වීමට බලපාන උෂ්ණත්ව තත්ත්ව මොනවාද ?
30.ඉතා අඩු උෂ්ණත්වයේදී පත්‍ර වල පිළිස්සීම් ලකුණු ඇති වීමට හේතුව කුමක්ද ?
31.වැඩි ආලෝක තීව්‍රතාවයක් ප්‍රිය කරන ශාක පහක් නම් කරන්න?
32.අඩු ආලෝක තීව්‍රතාවයක් ප්‍රිය කරන ශාක පහක් නම් කරන්න?
33.ප්‍රභාවර්ති චලන යන්න හඳුන්වන්න ?
34.ශාකවල පුෂ්ප හටගැනීම සඳහා ආලෝකය දක්වන ප්‍රතිචාරය හඳුන්වන නම කුමක්ද
35.ශාක කදේ පර්ව හා බීජාධරයේ වර්ධනයට හිතකර වන්නේ ආලෝකයේ කුමන වර්ණද?
36.කෙටි දින ශාක සඳහා උදාහරණ හතරක් ලියන්න ?
37.දිගු දින ශාක සඳහා උදාහරණ හතරක් ලියන්න ?
38.දින උදාසීන ශාක පහක් නම් කරන්න ?
39.ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශගුණික කලාප ගණන කීයද?
40. .ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප ගණන කීයද?
41.උච්චත්වය අනුව ශ්‍රී ලංකාවේ උප දේශගුණික කලාප නම් කරන්න ?
42.තෙත් කලාපයේ වාර්ෂික වර්ෂාපතන අගය කීයද?

ඒකකය -3 පස

1.පස නිර්මාණය වී ඇත්තේ කුමකින්ද ?
2.පාංශු ජනනය යන්න හඳුන්වන්න .
3.සම්භවය අනුව ප්‍රධාන පාෂාණ වර්ග කීයද? ඒවා නම් කරන්න ?
4.ආග්නේය පාෂාණ වලට උදාහරණ දෙකක් ලියන්න ?
5.හුණුගල්, වැලිගල් අයත් වන්නේ කුමන පාෂාණ වර්ගයටද ?
6.විපරීත පාෂාණ වලට උදාහරණ දෙකක් ලියන්න ?
7.ලංකාවේ බහුලවදැකිය හැකි නයිස් පාෂාණ වර්ග නම් කරන්න ?
8.පාෂාණ භෞතික ජීර්ණයට බලපාන සාධක ලියන්න ?
9.පාංශු පැතිකඩක් යනු කුමක්ද ?
10.පාංශු පැතිකඩක කාබනික ද්‍රව්‍ය බහුලම කලාපය කුමක්ද ?
11.පාංශු ඛනිජ ආකාර තුන නම් කරන්න /
12.අන්තර්ජාතික පාංශු විද්‍යා සංගමයේ වර්ගීකරණය අනුව පාංශු ඛනිජ වර්ග කර ලියන්න
13.කාබනික ද්‍රව්‍ය යනු මොනවාද ?
14.පසේ කාබනික ද්‍රව්‍ය තිබීමේ ප්‍රයෝජන හතරක් ලියන්න ?
15.කාබනික ද්‍රව්‍ය වියෝජනයේ අවසන් ඵලය කුමක්ද ?
16.පාංශු වාතයේ වේදගත්කම් තුනක් ලියන්න
17. වයුගොලීය වාතයට වඩා පාංශු වාතයේ වැඩිපුර ඇති වායුව කුමක්ද ?
18. පසේ ජලය පවතින ආකාර තුන ලියන්න.
19. ශාක වලට ලබාගතහැකි පාංශු ජල වර්ගය නම්කරන්න.
20. පස් අංශූන් වටා තදින් බැඳී ඇති ශාක වලට ලබගත නොහැකි ජල වර්ගය නම්කරන්න.
21. ක්ෂේත්‍ර ධාරිතාව යන්න හඳුන්වන්න.
22. බෝග වගාවට වඩාත් සුදුසු පාංශු තෙතමන මට්ටම හඳුන්වන නම කුමක්ද?
23. පාංශු ජීවීන් වර්ගකර දක්වන්න.

www.kedu.lk

24. පාංශු ක්ෂුද්‍රජීවීන්ට උදාහරණ ලියන්න.
25. පාංශු ජීවීන්ගේ ප්‍රයෝජන තුනක් කියන්න.
26. පසෙහි භෞතික ලක්ෂණ නම්කරන්න.
27. පාංශු වයනය හදුන්වන්න.
28. බෝග වගාවට වඩාත් සුදුසු පාංශු වයනය කුමක්ද?
29. මැටි පසක බිම් සැකසීමට සුදුසු නගුල් වර්ග දෙකක් ලියන්න.
30.පාංශු ව්‍යුහ ආකාර හතරක් ලියන්න.
31. බෝගවගවට වඩාත් සුදුසු ව්‍යුහ ආකාරය කුමක්ද?
32. පාංශු ව්‍යුහය විනාශවන ආකාර තුනක් ලියන්න.
33. පාංශු වර්ණය නිවැරදිව නිර්ණය කිරීමට භාවිතකලහැක්කේ කුමක්ද?
34. P H පරාසය ලියන්න.
35.පසක් ආම්ලික වන්නේ එහි කුමන යන වැඩිවීම නිසාද?
36. පසක් ආම්ලික වීමට හේතු දෙකක් ලියන්න.
37.ආම්ලිකත්වය ඉවත්කිරීමට පසට දියහැකි ද්‍රව්‍ය දෙකක් ලියන්න.
38. ක්ෂාරීය පසක P H අගය කොපමණද?
39. පසක් ක්ෂාරීය වීමට හේතු දෙකක් ලියන්න.
40. ක්ෂාරීය පසක් උදාසීන කිරීමට දියහැකි ද්‍රව්‍ය දෙකක් ලියන්න.
41. P H අගය මනින ක්‍රම ලියන්න.
42. කැටායන හුවමාරු ධාරිතාව මනින ඒකක මොනවාද?
43. ශ්‍රී ලංකාවේ බහුලව ව්‍යාප්තව ඇති පස් වර්ග තුනක් නම්කරන්න.
44. රතු දුඹුරු පස දක්නට ලැබෙන ප්‍රදේශ මොනවාද?
45. මාතලේ, මහනුවර, කෑගල්ල යන ප්‍රදේශ වල පැතිරී ඇති පස් කාණ්ඩය නම්කරන්න.
46. ගංඟා දෙපස ව්‍යාප්තව ඇති පස් වර්ගය කුමක්ද ?
47. පාංශු හායනය යන්න හදුන්වන්න.
48. පාංශු හායනයට හේතු තුනක් ලියන්න.
49. පාංශු ඛාදන කාරක ලියන්න.
50. පාංශු කාදන ක්‍රියාවලියේ අවස්ථා තුන ලියන්න.
51. වර්ෂාපතනය මගින් සිදුවන පාංශු ඛාදන ආකාර නම්කරන්න.
52. පස ආවරණය සදහා වගාකරන ආවරණ බෝග නම්කරන්න.
53.පසට වසුන් ලෙස යෙදිය හැකි ද්‍රව්‍ය තුනක් ලියන්න.
54. පස මතුපිටින් ගලායන ජලයේ වේගය අඩුකිරීමට යොදාගත හැකි ක්‍රම හතරක් ලියන්න
55. දෙවැටි සැකසීමේදී සමෝච්ජය ලකුණු කිරීමට භාවිතා කල හැකි සරල උපකරණයක් නම් කරන්න .

www.kedu.lk